මොරවැව ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු.75,000 ක් වටිනා පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මිලදී ගන්නා පොත් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | සභාව සතු රු.6,500,000 ක ස්ථාවර තැන්පතු පැවතියද එය අවසාන ගිණුම්වලට රු.6,481,927 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි ස්ථාවර තැන්පතු වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | ගිණුම්කරණයේදී මගහැරී ඇත. 2019 වසරේදී නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඇ) | කඩකුලී ලෙජරයෙහි ලැබිය යුතු කඩකුලී රු.71,592 ක් ලෙස සඳහන් වුවද එය රු.112,466 ක් ලෙස අවසාන ගිණුම්වලට ගෙන තිබුණි. | නිවැරදි කඩකුලී ලෙජරයන් පවත්වාගත යුතු වේ. | 2019 අවසන් ගිණුම් වලට ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඈ) | JCB යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය සඳහා වූ පොළිය රු.384,703 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගෙවිය යුතුණය පොළී අවසන් ගිණුම්වලට ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සේවක ණය, ණය ලේඛනයට අනුව රු.1,150,574 ක් වුවද, ශේෂ පත්‍රය අනුව එය රු.878,607 ක් වූ බැවින් රු.271,940 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | මීට වසර ගණනාවකට පෙර ස්ථාන මාරු වී ගිය නිලධාරීන් විසින් නිසි ලෙස ණය නොගෙවීම නිසා මෙම තත්ත්වය ඇතිවී තිබේ. වසර කිහිපයක් තිස්සේ මෙම ණය නැවත ගෙවන ලෙස අදාල නිලධාරීන් වෙත දැන්වූ නමුත් මෙතෙක් එම ණය පියවා නොමැත. එබැවින් ණය නොගෙවන්නේ නම් ඔවුනට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව ඔවුනට දන්වා ඇත. |

1.3.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.7,864,759 ක් වූ නමුත් මේ පිළිබඳව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඒ පිළිබඳව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම් නිරවුල් කළ යුතු වේ. | වසර කිහිපයකට පෙර අවසන් ගිණුම් සකස් කිරීමේදී සිදු වූ දෝෂයක් හේතුවෙන් මේ තත්ත්වය ඇතිවී ඇත. 2019 වසර තුළ නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.1,164,852 ක් වූ ගිණුම් විෂයයන් දෙකකට අදාලව ශේෂ තහවුරු වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස සංතෘප්තිමත් කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතුය. | අදාල මුදල් කඩිනමින් ලබාගැනීමට කටයුතු යොදා ඇත. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 454 | | බඩු ලේඛන පොත නිවැරදිව යාවත්කාලීන කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| | (i) 13 වැනි රීතිය | වර්ෂය ආරම්භවීමට පෙරාතුව අයවැයේ සහතික කරන ලද පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | වර්ෂය ආරම්භ වීමට පෙර සහතික කරන ලද අයවැය වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| | (ii) 17 වැනි රීතිය | නිශ්චිත ආකෘතියේ දැක්වෙන උප පත්‍රිකා ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | උප පත්‍රිකා ලේඛනයක් පවත්වාගෙන යා යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| | (iii) 76 වැනි රීතිය | කුලියට දෙනු ලබන කඩ කාමර සම්බන්ධයෙන් කුලී ලෙජරයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | කුලී ලෙජරයක් පවත්වාගෙන යා යුතුය. | අදහස් දක්වා නොමැත. |
| | (iv) 217 වැනි රීතිය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 324,795 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,657,153 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු,000 | රු,000 | රු,000 | රු,000 | රු,000 | රු,000 | රු,000 | රු,000 |
| වරිපනම් හා බදු | 62 | - | - | - | 112 | 8 | - | 70 |
| කුලී | 4,705 | 2,687 | 2,615 | 72 | 5,360 | 2,408 | 2,183 | 225 |
| බලපත්‍ර ගාස්තු | 251 | 219 | 219 | - | 50 | 166 | 166 | - |
| වෙනත් ආදායම් | 3,005 | 1,494 | 1,494 | - | 3,571 | 3,569 | 3,569 | - |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට සභාවට අයකර ගැනීමට පැවති උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු මේ වන තෙක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ගණන් දීමේ නිලධාරීන් විසින් අදහස් දක්වා නොමැත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යයසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහදිවුල්වැව ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයක් වූ සතිපොලක් ඉදි කිරීමට 2017 ඔක්තෝබර් 06 දින ප්‍රජා සංවිධානයකට රු.1,000,000 වටිනාකමකට පවරා තිබුණි. ප්‍රජා සංවිධානය විසින් අමුද්‍රව්‍ය මිල ඉහළ බැවින් අදාළ ඉදිකිරීම කළ නොහැකි බව දක්වා ඇතත් එය සනාථ කිරීමට විධිමත් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. එමෙන් ම සභාව විසින් නැවත මෙම කොන්ත්‍රාත්තුව වෙනත් සමිතියකට හෝ කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කිරීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍යතාවය සලකා බලා කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

(ඇ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාරිසරික හානි සිදු වන වී මෝල්, වඩු කර්මාන්ත, ගරාජ් සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ව්‍යවසායන් 16 ක් පාරිසරික බලපත්‍ර ලබා ගැනීමකින් තොරව අදාළ කර්මාන්ත පවත්වා ගෙන යමින් තිබුණි. | පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ව්‍යවසායන් සඳහා බලපත්‍ර ලබාදීමෙන් අනතුරුව ව්‍යාපාර කටයුතු කිරීමට ඉඩ සැලැස්විය යුතු වේ. | 2019 වසර තුළ එකී ගැටළුව නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | JCB යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් මාසික වාරික 60 කින් ගෙවා නිම කිරීමට 2013 මැයි මස ලබා ගත් රු.9,520,000 ක ණය මුදල නියමිත පරිදි නොගෙවීම නිසා රු.4,523,342 ක වාරික මුදල් හා පොළී මුදල් සභාවට ගෙවීමට ඉතිරිව පැවතුණි. | ණය වාරික හා පොළී ගෙවීමට කටයුතු කළ යුතුය. | සභාවේ ආදායම් තත්ත්වය ඉතා පහල මට්ටමක පවතින බැවින් නිසි කලට ණය වාරික ගෙවීමට අපොහොසත් වීම නිසා මෙම තත්ත්වය ඇතිවී ඇත. මේ වන විට හිඟ ණය වාරික වලින් කොටසක් ගෙවා ඇති අතර ඉදිරියේදී එය නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | සභාවේ සියලු මන්ත්‍රීන්ට රු.100,000 ක් බැගින් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට අතිගරු ජනාධිපති විසින් 2018 වර්ෂයේ ලබා දී තිබූ රු.10,000,000 ක මුදල වැය කිරීම වෙනුවෙන් සභාව විසින් අනුමත කරන ලද නිශ්චිත සැලැස්මක් නොතිබුණි. තවද එක් මන්ත්‍රීවරයෙකු රු.59,975 ක් වටිනාකමින් යුතු භාණ්ඩ ඔහුගේ කාර්යාල භාවිතය සඳහා මිලදී ගෙන තිබුණි. | ප්‍රදානය කරන ලද මුදල් ඵලදායී සංවර්ධන කටයුතු සඳහා සභාව අනුමත කරන ලද සැලැස්මකට අනුව යෙදවිය යුතු වේ. | එකී භාණ්ඩ නැවත ප්‍රාදේශීය සභාව වෙත භාර දෙන ලෙස අදාල මන්ත්‍රීවරයා වෙත ලිඛිතව දැනුම් දී ඇත. ඒවා ඉදිරියේදී සභාව වෙත හරගැනීමට කටයුතු යොදා ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුස්තකාලයාධිපති, විදුලි කාර්මික නිලධාරි, කළමනාකාර සහකාර හා සංවර්ධන නිලධාරී යන තනතුරුවල වර්ෂ 05 කට වැඩි කාලයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | කළමනාකරණ සහකාර, සංවර්ධන නිළධාරි සහ පුස්තකාලාධිපති තනතුරු සඳහා ඉදිරියේදී සිදුකරන බඳවාගැනීම් වලදී නිලධාරීන් අනුයුක්ත කරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) විසින් දැනුම් දී ඇත. විදුලි කාර්මික නිලධාරිවරයෙකු බඳවා ගැනීමේ කටයුතු මේ වන විට සිදු වන අතර නොබෝ දිනකින් පත්වීම් ලබාදීමට නියමිතය. |
| (ආ) | සේවය හැරගිය සේවකයන් සිව්දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු. 100,145 ක් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ජේදයේ 4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල ණය මුදල් පියවන ලෙස වාර ගණනාවක් ණයකරුවන් වෙත දැනුම් දී ඇතත් ගෙවීම් නොකර සිටී. ඔවුන්ට විරුද්ධව ඉදිරියේදී නීතිමය පියවර ගැනීමට කටයුතු යොදා ඇත. |

3.4 ප්‍රසම්පාදනය

3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 ට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

3.4.2 බහුකාර්යය ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම-අංක 01

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල සඳහා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත සහ අංක 392/9 1986 මාර්තු 10 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | පළමු මහලේ කොන්ක්‍රීට් ඇතිරීම, බිත්ති කපරාරු කිරීම, ලින්ටල් කපරාරු කිරීම හා ඇතුළත බිත්තිවල තීන්ත ආලේප කිරීම සඳහා රු.194,999 ක් ගෙවිය යුතු වුවද සභාව විසින් එම කාර්යයන් සඳහා රු.270,374 ක් ගෙවීමට නිර්දේශ කර තිබූ බැවින් රු.75,375 ක මුදලක් වැඩිපුර ගෙවීම සඳහා බිල්පත්‍ර සහතික කර පළාත් පාලන දෙපාර්තමේන්තුවට යවා තිබුණි. | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගණන් දීමේ නිලධාරීන් විසින් අදහස් දක්වා නොමැත. |
| (ඇ) | ප්‍රජා සංවිධානය විසින් වටිනාකම රු.114,075 ක් වූ භාණ්ඩ වර්ග 04 ක් 2018 අප්‍රේල් 11 දින වන විටද සැපයීමට කටයුතු කර නොතිබුණු නමුත් එම භාණ්ඩ ලැබී ඇති බවට සහතික කර ගෙවීම සඳහා බිල්පත්‍ර ඉදිරිපත් කර තිබුණි. | ප්‍රජා සංවිධානයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගණන් දීමේ නිලධාරීන් විසින් අදහස් දක්වා නොමැත. |
| (ඈ) | කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2017 නොවැම්බර් 06 දිනට පෙර නිමකළ යුතු වුවද කොන්ත්‍රාත්කරු විසින් 2018 අප්‍රේල් 11 දින වන විටද එහි වැඩ නිමකර නොතිබුණි. කෙසේ වුවද | වැඩ නිම කිරීම්වලින් පසු නිම කිරීමේ සහතිකය නිකුත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

සභාව විසින් ඉහත වැඩ සතුටුදායක ලෙස නිමකර ඇති බව සහතික කරමින් වැඩ නිමකිරීමේ සහතිකය 2017 දෙසැම්බර් 26 දින නිකුත් කර තිබුණි.

3.4.3 බහුකාර්යය ගොඩනැගිල්ල ඉදි කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ඉදි කළ බහුකාර්යය ගොඩනැගිල්ල සඳහා අයකල යුතු වූ ප්‍රමාද ගාස්තු වන රු.327,617 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වසර තුළ එම ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමට කටයුතු කරමි. |

3.4.4 මයිලකුඩා වැව ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුර නැගුම ව්‍යාපෘතිය යටතේ මයිලකුඩා වැව ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ දෙවන අදියර සඳහා කොන්ත්‍රාත් ගිවිසුමෙහි 6.4 ප්‍රකාරව අයකලයුතු ප්‍රමාද ගාස්තුව රු. 168,012 ක් විය. එහෙත් අඩුකර තිබුණේ රු. 60,004 ක් බැවින් අඩුවෙන් අයකළ ප්‍රමාද ගාස්තුව රු. 108,008 ක් විය. | ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වසර තුළ එම ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමට කටයුතු කරමි. |